# දියවැඩියාව වැළැක්වීමට පුංචි මමත් සූදානම්



ඉනුකි ලිතුම්සා බණ්ඩාර

# දියවැඩියාව වැළැක්වීමට පුංචි මමත් සූදානම්

ප්‍රථම එළිදැක්වීම - 15.11.2023
ISBN 978-624-206-667-7

ඉනුකි ලිතුම්සා බණ්ඩාර

# පිදුම

මෙම පොත
මගේ ආදරණීය
අක්කාට
පුද කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
**විදුහල්පතිනිය**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**
**2023.11.01**

දියවැඩියාව කියන්නේ ඇඟේ සීනි ප්‍රමාණය වැඩිවන රෝගයකි. පුංචි අපිත් පැණිරස කන්න කැමතියි. අපේ පවුලේ අත්තම්මටයි, ලොකු අම්මටයි, ලොකු මාමාටයි දියවැඩියාව තියනවා. ඒ නිසා අපිටත් දියවැඩියාව හැදෙන්න පුළුවන් කියලා අම්මා කීවා.




අපේ ගෙදරට ගෙනෙන කෑම වර්ග දැන් ටිකක් වෙනස්. ඉස්සර වගේ බිස්කට් ජාති, පැණි රස ජාති ගේනවා අඩුයි. අක්කයි මමයි ඉස්සර වගේ දකින දකින පැණිරස කෑම ඉල්ලලා අඬන්නේ නෑ.




පැණි රස කෑම වෙනුවට මම ගොඩක් පලතුරු කනවා.
අපි ඉස්සර අඹ, කෙසෙල් ගෙඩි, අන්නාසි වැනි පලතුරු තමයි කෑවේ. ලංකාවේ හැදෙන වෙරළු, නෙල්ලි, උගුරැස්ස, කාමරංගා, පේර, අලිපේර හා වැල් දොඩං වගේ පලතුරු දැන් නිතරම අපේ ගෙදරට ගේනවා.




මම සුදු බත් වෙනුවට දැන් කන්නේ රතු බත්. ගොඩක් එළවළු ජාති, පලා වර්ග අම්මා මගේ බත් පිඟානට එකතු කළා.




පිටි තියෙන කෑම වැඩිපුර කෑවම දියවැඩියාව හැදෙනවලු. පිටි කෑම අඩු කළා.



ප්‍රෝටීන් ගොඩක් තියෙන මාළු වර්ග, මස් වර්ග හා බිත්තර නිතරම කෑමට ගත්තා. මම උදේ, දවල් හා රාත්‍රී ආහාර වේල් වලට අමතරව බිස්කට් හා ක්ෂණික ආහාර කන්නේ කලාතුරකින්. හවසට අපි දැන් බොන්නේ පළතුරු බීම. මට දැන් ඉස්සර වගේ බඩගිනි වෙන්නේ නෑ.



අම්මයි, තාත්තයි ව්‍යායාම සඳහා හැමදාම උදේ වැව රවුමේ දුවනවා. මමයි අක්කයි නිවාඩු දවසට අම්මයි, තාත්තයි එක්ක එකතු වෙනවා. මම දැන් පාසලේ ව්‍යායාම වැඩසටහනට සතුටින් සහභාගී වෙනවා.



මම චෙස් ක්‍රීඩාව කරනවා. අම්මා කිව්වේ චෙස් කියන්නේ මනස වෙහෙස කරන ක්‍රීඩාවක් කියලා. ඒ නිසා මම බැට්මින්ටන් ක්‍රීඩාව පටන් ගත්තා. බැට්මින්ටන් කියන්නේ ඇඟ මහන්සි කරන ක්‍රීඩාවක්.



හැම සති අගකම වගේ අපි පොඩි විනෝද චාරිකාවක් යනවා. එකෙන් අපේ මනස සැහැල්ලු වෙනවා කියලා තාත්තා කීවා. එතකොට ලෙඩ හැදෙන්නේ අඩුවෙන්ලු. අලුත් සතිය සතුටින් ආරම්භ කිරීමට හැකි වෙනවා.



මම දැන් සතුටින්. අපි හැමෝම මෙහෙම වෙනස් වුනොත් දියවැඩියාවෙන් තොර ලස්සන හෙටක් තියේවි.





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

**මෙයට**
**සෙනෙවිරත්න මහලේකම්**
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක**
**2023.11.01**